තුරුසවිය අරමුදල

මුදල් අමාත්‍යාංශය



වාර්ෂික වාර්තාව-2020

CM 34661 - 350 (2021/11) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පටුන

	පිටු අංකය
තුරුසවිය අරමුදලේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය	05
ආයතනික තොරතුරු	06
සභාපතිතුමාගේ පණිවුඩය	07
අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය	08
ආයතනික කාර්යභාරයන්	09
තුරුසවිය අරමුදලේ කළමනාකරණ මණ්ඩලය හා විගණන හා කළමනාකරණ කමිටුව	10
තුරුසවිය අරමුදලේ සේවක මණ්ඩලය	11
තුරුසවිය අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ කාර්යභාරයන්	12
ප්‍රාදේශීය කාර්යාලවලින් ඉටුකරන ප්‍රධාන සේවාවන්	13
රබර් ක්ෂේත්‍රයේ පැතිරී පවතින දිස්ත්‍රික්කයන්- තුරුසවිය අරමුදල	14
තුරුසවිය අරමුදලේ ප්‍රගති සමාලෝචනය	15-20
තුරුසවිය සමිති සාමාජිකයින් වෙනුවෙන් පුහුණු වැඩසටහන්	21-24
පැවැත්වීම හා සම්පත් බෙදාදීම	
අවසන් ගිණුම් වාර්තාව 2020	25-38
විගණකාධිපති වාර්තාව 2020	39-46

දැක්ම

දේශීය රබර් කර්මාන්තය

ශ්‍රී ලංකාවේ පළමු පෙළේ

විදේශ විනිමය උපයන කර්මාන්තයක්

බවට පත් කිරීම.

මෙහෙවර

රබර් කර්මාන්තයේ වැඩි ඵලදායිතාවය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම මගින්

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ආර්ථික තත්ත්වය නංවාලීමට කටයුතු කිරීමෙන්

සමස්ත දේශීය රබර් කර්මාන්තය ශක්තිමත් කිරීම හා

ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම.

තුරුසවිය අරමුදලේ හර වටිනාකම්

සන්තුෂ්ටිය

ඒකාබද්ධතාවය

සුරක්ෂණතාවය

සේවක සන්තුෂ්ටිය

ගුණාත්මකභාවය

ආයතනික තොරතුරු

ආයතනයේ නම - තුරුසවිය අරමුදල

නෛතික තත්ත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ පූර්ණ අයිතිය සතු ආයතනයකි.

අමාත්‍යාංශය - මුදල් අමාත්‍යාංශය

ලියාපදිංචි කාර්යාලය - තුරුසවිය අරමුදල,
අංක 39,
ශ්‍රී සුභූතිපුර,
බත්තරමුල්ල.

දුරකථන - සභාපති 011-2863937
- අධ්‍යක්ෂ 011-2863936
- පොදු 011-2863786
- ෆැක්ස් 011-2863786
- ඊමේල් : thurusaviya2000@gmail.com
- වෙබ් අඩවිය : http://thurusaviya.gov.lk

සභාපතිතුමාගේ පණිවුඩය

"රට හඳුන සෞභාග්‍යයේ දැක්ම" නව රාජ්‍ය ප්‍රතිපත්ති හා තුරුසවිය අරමුදලේ අරමුණුවලට සමගාමීව 2020 වර්ෂය තුළ තුරුසවිය අරමුදල වාර්ෂික ඉලක්ක ගත සංවර්ධන වැඩ කටයුතුවලින් විශාල ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි වූ බව ඔබ සැමට දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. මෙම ජයග්‍රහණය මාගේ කාර්ය මණ්ඩලය ළඟා කර ගන්නේ පසුගිය වර්ෂයේ පැවති කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ පැවති අභියෝගවලටද සාර්ථකව මුහුණ දෙමිනි. මෙම ගෝලීය වසංගත තත්ත්වය හමුවේ වුවද කුඩා රබර් ඉඩම් හිමියන් රැක බලා ගැනීමට මාගේ කාර්යය මණ්ඩලය නිරතුරුවම කැපවී ක්‍රියා කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

දිවයින පුරා විසිරී සිටින කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ගැටලු හඳුනා ගනිමින්, ඒ සඳහා ඵලදායීවූත්, කාර්යක්ෂම වූත් විසඳුම් ලබාදීම මගින් යථොක්ත ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබුණු බව දන්වමි.තවද තුරුසවිය අරමුදල මගින් කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ආර්ථික හා සාමාජීය පීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා 2020 වර්ෂයේදී ද සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනු ලැබීය.

එකී සියලුම කාර්යයන් සඳහා අපට නිසි මග පෙන්වමින් නිරතුරුවම මා ඇතුළු මාගේ කාර්යය මණ්ඩලය දිරිමත් කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, මුදල් අමාත්‍යංශයේ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් මාගේ කෘතඥතාවය එල කර සිටිමි.

එමෙන්ම අප ආයතනය සෘජු අධීක්ෂණයට ලක් කරමින් "විශේෂ සංවර්ධන ව්‍යාපෘති" වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නා වූ වැවිලි අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමන්ට, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට,වැවිලි රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මැතිතුමන්ට, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට, අනෙකුත් සහෝදර ආයතන වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, රබර් පර්යේෂණායතනයේ, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ, රබර් ලේකම් කාර්යාලයේ සියලුම නිළධාරීන්ට සහ තුරුසවිය අරමුදලේ කළමනාකරණ මණ්ඩලයටද, සියලුම දිස්ත්‍රික්කයන්හි තුරුසවිය සමිතිවල සභාපතිවරුන් හා ලේකම්වරුන් ඇතුළු සියලුම සාමාජිකයින් වෙත මෙන්ම මා හට නිබඳ ශක්තියක් ලබා දෙන්නා වූ තුරුසවිය අරමුදල කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි.

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් නව සංවර්ධන ව්‍යාපෘති රබර් ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරමින්, කුඩා රබර් ඉඩම් හිමියන් රැක බලා ගනිමින් ඉදිරියටත් දිගු ගමනක් යාමට තුරුසවිය අරමුදලට ශක්තිය ධෛර්යය ලැබේවා! යි ප්‍රාර්ථනා කර සිටිමි.

.....

විජිත ලොකුනාරංගොඩ

සභාපති

අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

පසුගිය වර්ෂවලට වඩා නව මුහුණුවරකින් වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් අභියෝග ජය ගැනීම සඳහා රබර් වගාවේ නියැලී සිටින කුඩා රබර් වතු හිමියන් උදෙසා නව මුහුණුවරකින් ආර්ථික සමාජයීය හා පාරිසරික වශයෙන් ඔවුන්ගේ නිෂ්පාදන හා ඵලදායීතාවය ඉහළ නැංවීම උදෙසා භෞතික හා මූල්‍ය සම්පත් ලබාදී රබර් ගොවියා දිරි ගැන්වීමට කටයුතු කළ බව සතුටින් දන්වනු කැමැත්තෙමු.

තවද රබර් ක්ෂේත්‍රයේ ඉහළ වර්ධනයක් වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කර ආර්ථික සමාජයීය හා පාරිසරික වශයෙන් ඵලදායීතාවය, ලාභදායීතාවය සහ තිරසාරත්වය ඉහළනැංවීමට කටයුතු කර ඇත. තුරුසවිය අරමුදල ආයතනය කුඩා රබර් ඉඩම් හිමියන් වෙනුවෙන් ඔවුන්ගේ අභිලාෂයන් මුදුන්පත් කිරීමටත් රබර් වගාවේ නියුතු මුළු මහත් ජනතාවට ඉමහත් සේවාවක් සැලසීම තුරුසවිය අරමුදලේ අපේක්ෂාවය. ඒ අනුව මෙම ආයතනය ලාභාංශ ලැබීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන ආයතනයක් නොවන අතර කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම මගින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීමට සහාය වීමට මහත්සේ වෙහෙසක් දරන්නා වූ ආයතනයක් යැයි කීම නිවැරදිය. මෙම වර්ෂයේ රබර් වගාවේ උන්නතිය උදෙසා විශේෂිත වූ වැඩසටහන් කිරි අස්වනු සහායක පුහුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමටත් ඉදිරි වර්ෂවල යෝජිත ඉලක්ක සපුරා ගැනීමටත් වැවිලි ක්ෂේත්‍රයේ නව සංවර්ධන ප්‍රගතියක් ලබා ගැනීමටත් හැකිවේ යැයි මා විශ්වාස කරමි.

තවද තිරසාර සංවර්ධනයක් උදෙසා තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම ලබා දෙමින් ව්‍යාප්ත සේවාව තුළින් කුඩා රබර් ඉඩම් හිමියන් විද්‍යාත්මක ගොවීන් පිරිසක් බවට පත්කිරීම හා දේශීය ආර්ථිකය නංවාලීම සඳහා දහදිය හා ශ්‍රමය වැයකර රබර් වගාව වෙනුවෙන් තම ශක්තිය කැප කරන කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ජීවිතය ශක්තිමත් කිරීම සඳහා ඇප කැප වූ අපගේ සහෝදර ආයතන වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා රබර් පර්යේෂණායතනයේ සියලු දෙනාත් අප ආයතනයේ දියුණුව උදෙසා මාර්ගෝපදේශ ලබා දෙමින් අප හට මහත් ශක්තියක් ලබා දෙමින් කටයුතු කරන වැවිලි අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මුදල් අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ලබා දුන් සහයෝගයට කෘතඥතාවය පළ කර සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමින් මුළු මහත් ශ්‍රී ලංකා රබර් ඉඩම්හිමියන් සඳහා තුරුසවිය අරමුදල ශක්තියක් වේවා! යි සුභාශිංසන පිරිනමමි.



.....

නීතිඥ ආචාර්ය කාංචන සිල්වා

අධ්‍යක්ෂ

තුරුසවියේ ආයතනික කාර්යභාරයන්

තුරුසවිය අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනත මගින් ස්ථාපිත කරන ලද සංස්ථාවකි. එය බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර, අංක 39 ස්ථානයේ පිහිටා ඇත.

මෙරට රබර් කර්මාන්තයේ උපයනු ලබන විදේශ විනිමය වැඩිකොටසක් එනම් 68%ක් පමණ උපයනු ලබන්නේ කුඩා රබර් ඉඩම් හිමියන් විසිනි. දේශීය වෙළෙඳපොළ මෙන්ම ලෝක වෙළෙඳපොලේ ද ස්වාභාවික රබර් සඳහා ඇති ඉල්ලුම ඉහළ යන ප්‍රවණතාවක් පවතී.

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා වෙළෙඳපොල නැංවීම මගින් ජාතික මට්ටමින් ඔවුන් ශක්තිමත් කිරීම තුරුසවිය අරමුදලින් සිදු කරයි. කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මහනුවර, රත්නපුර, ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, මොනරාගල, බදුල්ල, අම්පාර යන දිස්ත්‍රික්කවල ගම් මට්ටමින් විසිරි ඇති කුඩා රබර් ඉඩම් හිමියන් ඒකරාශී කර ප්‍රාථමික තුරුසවිය සමිති පිහිටුවා ඇති අතර එම ප්‍රාථමික තුරුසවිය සමිති නියෝජනය කරමින් කළුතර, කෑගල්ල, රත්නපුර, ගාල්ල හා කොළඹ යන දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශීය තුරුසවිය සමිති (දිස්ත්‍රික් සංවිධාන) 05ක් පිහිටුවා ඇත. ප්‍රාදේශීය තුරුසවිය නියෝජනය කරමින් ශ්‍රී ලංකා කුඩා රබර් වතු සංවර්ධන සමිති සම්මේලනය පිහිටුවා ඇත.

තුරුසවිය අරමුදල පනතට අනුව තුරුසවිය අරමුදල පිහිටුවීමේ පරමාර්ථ

(අ) කුඩා රබර්වතු හිමියන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරවීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම.

(ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

(ඇ) කුඩා රබර්වතු වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීම සඳහා අවශ්‍ය රබර් පිරිසැකසුම් ඒකක සහ රබර් කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම වැඩිදියුණු කර ගැනීම හෝ පිහිටුවීම.

(ඈ) එවැනි රබර් පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.

(ඉ) කුඩා රබර්වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති)ලියාපදිංචි කිරීම සහ විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයන් සඳහා ආධාර ලබා දීම.

(ඊ) කුඩා රබර්වතුවල රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ වැඩිදියුණුව හා යහපත සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීම.

තුරුසවිය අරමුදලේ උපායමාර්ගික සංවර්ධන අරමුණු

01 තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබා දීම.

02 පරිසර සංරක්ෂණය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.

03 කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදන සඳහා නියම මිලක් ලබා දීම.

04 කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

තුරුසවිය අරමුදල කළමනාකරණ මණ්ඩලය - 2020

විජිත ලොකුනාරංගොඩ මහතා	සභාපති - තුරුසවිය අරමුදල
ජේ. එම්. මංගලනිස්ස මහතා	සාමාජික - (අධ්‍යක්ෂ ජනරාල් - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව)
එච්. ඒ. ඩී. රුක්ෂාණි මහත්මිය	නිරීක්ෂක - (නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් අමාත්‍යාංශය)
මහින්ද විද්‍යානපතිරණ මහතා	සාමාජික - (සභාපති - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය)
ජී. ඩී. ටී. එස්. පෙරේරා මහතා	සාමාජික - (ප්‍රධාන ගණකාධිකාරී - වැවිලි අමාත්‍යාංශය)
ඩී. ඩී. කේ. චන්ද්‍රකීර්ති මහතා	සාමාජික - (සභාපති - ශ්‍රී ලංකා රබර් වතු සංවර්ධන සමිති සම්මේලනය)
රෝහණ ගලබඩ මහතා	සාමාජික -(සභාපති - කළුතර ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)
පියසේන මහආරච්චි මහතා	සාමාජික -(සභාපති - ගාල්ල ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)
බී. ඒ. සම්පත් ප්‍රේමරත්න මහතා	සාමාජික -(සභාපති - කෑගල්ල ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)
දිනේෂ් මහින්ද මහතා	සාමාජික -(සභාපති - රත්නපුර ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)
ජේ. ඩී. එස්. වික්‍රමරත්න මිය	සාමාජික - (සභාපති - කොළඹ ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)

තුරුසවිය අරමුදල විගණන හා කළමනාකරණ කමිටුව - 2020

ජේ. එම්. මංගලනිස්ස මහතා	අධ්‍යක්ෂ ජනරාල් (රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව)
එච්. ඒ. ඩී. රුක්ෂාණි මහත්මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් අමාත්‍යාංශය)
ජී. ඩී. ටී. එස්. පෙරේරා මහතා	ප්‍රධාන ගණකාධිකාරී (වැවිලි අමාත්‍යාංශය)
බී. ඒ. සම්පත් ප්‍රේමරත්න මහතා	සභාපති (කෑගල්ල ප්‍රාදේශීය තුරුසවිය සමිතිය)
කේ. ඩී. නිලානි ජයසිරි මහත්මිය	විගණන අධිකාරි (විගණකාධිපති දෙපාර්තමේන්තුව)

තුරුසවිය අරමුදල - සේවක මණ්ඩලය

සභාපති	විජිත ලොකුනාරංගොඩ මහතා
අධ්‍යක්ෂ	නීතීඥ ආචාර්ය කාංචන සිල්වා මහතා
ගණකාධිකාරි	ජේ. පී. පී. වී. බණ්ඩාර මහතා
පරිපාලන නිලධාරි	සමන්මලී මාතරගේ මිය
ප්‍රවර්ධන නිලධාරි	ඩිලාන් තරංග ගුණවර්ධන මහතා
කළමනාකරණ සහකාර (තාක්ෂණ)	ඒ. වී. බී. ජේ. ගුණරත්න මහතා
කළමනාකරණ සහකාර(තාක්ෂණ නොවන)	ආර්. දෙහිපිටිය මිය
	එල්. ඒ. පී. චන්ද්‍රිකා මිය
	අයි. එච්. ඩී. අයි. මධුෂාණී මිය
	අයි. කේ. මුණසිංහ මිය
	පී. කේ. එස්. කුමාර මහතා
	මල්ෂානි සෙනවිරත්න මෙනවිය
	එස්. වී. ටී. ප්‍රියංගිකා මිය
	එල්. පී. තත්සරණී මෙනවිය
	ඩී. එම්. එම්. කුමාරිහාමි මෙනවිය
	එන්. ඩී. රාජපක්ෂ මිය
	කේ. ඒ. චතුරංග මහතා
	කේ. ඩබ්. එම්. සී. ප්‍රියදර්ශණී මිය
	ආර්. එම්. ඒ. රත්නායක මිය
	ඩබ්. ආර්. එස්. ඩබ්. බණ්ඩාර මහතා
	ඩබ්. එස්. පී. ජයවර්ධන මහතා
	පී. පී. ජේ. එන්. සේනානායක මිය
	කේ. කේ. එන්. සඳරුවන් මහතා
	(සංවර්ධන නිලධාරී වැවිලි අමාත්‍යාංශය)
	ඩී. ඩී. ජයසූරිය මහතා
	(සංවර්ධන නිලධාරි වැවිලි අමාත්‍යාංශය)
රියැදුරු	යූ. ලාල් ප්‍රියන්ත මහතා
	ශිවන්ත උදයංග මහතා
කාර්යාල කාර්ය සහායක	ප්‍රසන්න සමරතුංග මහතා
	ධම්මික විජේසිරි මහතා

තුරුසවිය අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

- 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතට අනුව, පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- බිම් මට්ටමේ විසිරී ඇති කුඩා රබර් වතු හිමියන් ඒකරාශී කර ඔවුන් දැනුවත් කර තුරුසවිය සමිති පිහිටුවීම.
- පිහිටුවා ගත් තුරුසවිය සමිති තුරුසවිය අරමුදල යටතේ ලියාපදිංචි කිරීම.
- කුඩා රබර් ඉඩම් හිමියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් පිහිටුවා ඇති තුරුසවිය සමිති සාමාජිකයින් සඳහා සේවාවන් සැපයීම.
- ගුණාත්මකභාවයෙන් යුතු රබර් ෂීට් නිෂ්පාදන සඳහා තාක්ෂණික දැනුම ලබාදීම.
- මනා කළමනාකාරිත්වයකින් යුතු සමිතියක සාමාජික හා ආර්ථික වැදගත්කම පිළිබඳව කුඩා රබර් හිමියන් දැනුවත් කිරීම.
- කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයෙන් හා වෙනත් ආයතනවලින් රබර් වගාව වැඩිදියුණු කිරීම සඳහා ලැබෙන යෝජනා ප්‍රශ්නවලට කඩිනම් පිළිතුරු ලබා දීම.
- පරිපාලන හා ගිණුම්කරණ කටයුතු කිරීම.

ප්‍රාදේශීය කාර්යාලවලින් ඉටු කරන ප්‍රධාන සේවාවන්

දිස්ත්‍රික්කයේ රාජකාරී කටයුතු සඳහා තුරුසවිය සම්බන්ධීකරණ නිලධාරීන් ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ඇති තුරුසවිය සමිති අධීක්ෂණය සඳහා පහත සඳහන් රාජකාරී ඉටු කරනවා ඇත.

- මාසික ඉදිරි වැඩසටහන් ප්‍රධාන කාර්යාලය වෙත යවා, අනුමත කරගනු ලබන අතර, එම මාසික ඉදිරි වැඩසටහන් සංශෝධනය කරන්නේ නම් සංශෝධිත වැඩසටහන් ද, එකී මාසය අවසානයේ ඉටු කළ වාර්තාද, ප්‍රධාන කාර්යාලයට යවා ඒ පිළිබඳ සමාලෝචන හා ඊළඟ මාසයේ කළයුතු වැඩ සම්බන්ධව අවශ්‍ය පැවරීම් පිළිබඳ උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීම.
- මාස 03 කට වරක් පැවැත්වූ මහා සභා රැස්වීම්වලට සහභාගී වීම.
- තුරුසවිය සමිති අධීක්ෂණ වාර්තා ප්‍රධාන කාර්යාලයට එවීම.
- ගම් මට්ටමින් නව තුරුසවිය සමිති පිහිටුවීම.
- අක්‍රීයව පැවති තුරුසවිය සමිති ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සැලසීම.
- ගොවි ගැටලු ප්‍රධාන කාර්යාලයට යොමු කර ඒ සඳහා විසඳුම් ලබාගැනීම.
- නිලවරණ පැවැත්වීම.
- ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම හා කුඩා රබර් ඉඩම් හිමියන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා වෙළෙඳපොලක් බිහි කිරීම.

රබර් වගාව පැතිර පවතින දිස්ත්‍රික්කයන්



තුරුසවිය අරමුදලේ ප්‍රගති සමාලෝචනය

2020 වසර තෙක් තුරුසවිය සමිති ව්‍යාප්තිය

අනු අංකය	දිස්ත්‍රික්කය	මුළු සමිති සංඛ්‍යාව
01	කළුතර	199
02	කොළඹ	21
03	ගම්පහ	19
04	රත්නපුර	106
05	ගාල්ල	47
06	මාතර	21
07	හම්බන්තොට	04
08	කෑගල්ල	213
09	මහනුවර	13
10	මාතලේ	01
11	කුරුණෑගල	11
12	මොනරාගල	122
13	අම්පාර	35
14	බදුල්ල	04
	එකතුව	**816**

තුරුසවිය සමිති ශක්තිමත් කිරීම හා ප්‍රතිසංවිධානය වෙනුවෙන් සිදු කරනු ලැබූ කාර්යභාරයන්

- මහාසභා රැස්වීම, සමිති රැස්වීම්, දිස්ත්‍රික් සංවිධානය, සමස්ත ලංකා සංවිධානය පිහිටුවීම.
- රබර් ෂීට් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා මූල්‍යාධාර ලබා දීම
- රබර් මිලදී ගනු ලබන පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය කිරීමේ කටයුතු සිදු කිරීම
- ලංකා බැංකුව සමඟ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2020 වසර තුළ ලබා ගත් ණය ප්‍රමාණය

සාමාජිකයින් ගණන	සාමාජිකයින් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය
4	රු.925,000.00

➢ *කොවිඩ්-19 තත්ත්වය නිසා ණය ලබා ගැනීම් අවම වී ඇත.*

නවක රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය (2020)

දිස්ත්‍රික්කය	ස්ථානය
කෑගල්ල	දිසා උපදේශක කාර්යාලය
රත්නපුර	ගොඩකවෙල සණස රැස්වීම් ශාලාව
මොනරාගල	කුඹුක්කන රබර් පර්යේෂණායතනය
අගලවත්ත	නිවිතිගල කැලේ රබර් පර්යේෂණායතනය

මූල්‍ය ප්‍රතිපාදන - වැවිලි අමාත්‍යාංශය

සංවිධානය හා මෙහෙයවීම - තුරුසවිය අරමුදල

සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය උපදේශක සේවා දෙපාර්තමේන්තුව

ලැබුණු මුදල - රු.මි.4,964,852.22

වියදම් වූ මුදල - රු.මි.3,226,292.33
(2020.12.31 දිනට)

- *පුහුණු වැඩසටහන් 07ක් සිදු කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා මූල්‍ය ඉලක්කය වූයේ රු.මි.7.5 කි.නමුත් අනපේක්ෂිත ලෙස මුහුණ පෑ කොවිඩ්-19 තත්ත්වය හමුවේ ඉන් වැඩසටහන් 04 ක් පමණක් සැලසුම් කළ පරිදි අවසන් කිරීමට හැකි විය.*

2020 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

- සහනාධාර පදනම මත දියරෝල්, ඩයමන්ඩ් රෝල් හා ඇළුමිනියම් තැටි ලබාදීම

රෝල් පෝඩු	- 88
ස්වාභාවික රබර් බූට්ස්	- 1600
හෙඩ් ටෝච්	- 1600

පුහුණු වැඩසටහන් පැවැත්වීම

වැඩසටහන්	- 34
මේ වන විට දැනුවත් කර ඇති සමිති සාමාජිකයින් ගණන	- 1618

- නව තාක්ෂණික එක් දින වියදම් කුටීර හා සාම්ප්‍රධායික දුම්ගෙවල් ඉදිකිරීම

දුම්ගෙවල්	- 70



තුරුසවිය අරමුදල කාර්යභාරය

සමස්ත ආයතනික වගකීම

රබර් වගාවේ නිරතව සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර ඔවුන්ගේ යටිතල පහසුකම් දියුණුව ඒ තුළින් ස්වයංපෝෂිත ජන සමාජයක් ගොඩනගා ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබාදීම අප ආයතනයේ අභිලාෂයයි. රබර් වගාවේ සංවර්ධනය සඳහා කුඩා රබර් හිමියන් වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමින් පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවා ගනිමින් සම්බන්ධීකරණ නිලධාරීන් පත් කර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

අපේ ගමන් මග කෙටියෙන්

- කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන් රබර් ගොවියා ශක්තිමත් කිරීම.
- රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ආර්.එස්.එස්.නො. 01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් කුඩා රබර් වතු හිමියන්ට ලබාදීම.
- වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සම්පත් බෙදාදීම - දියරෝල්, ඩයමන්ඩ් රෝල් , ස්වාභාවික රබර් බූට්ස්, හෙඩ් ටෝච් සහනාධාර පදනම යටතේ ගොවීන්ට බෙදා දීම.

2020 වර්ෂයේ තුරුසවිය අරමුදල ආයතනයේ ප්‍රගති සමාලෝචනය

ආයතනයේ නම - තුරුසවිය අරමුදල

අංකය	විස්තරය	ඇස්තමේන්තුවේ වටිනාකම රු.මි.	මූල්‍ය ඉලක්ක රු.මි.	මූල්‍ය ප්‍රගතිය රු.මි.	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
01	**සම්පත් බෙදා දීම**					
	1. රෝල් පෝඩු සහනාධාර	3.030	3.03	3.146	88 100% (රෝල් පෝඩු)	88 100% (රෝල් පෝඩු)
	2. ගම් බූට්ස් / හිසේ පළඳිනා විදුලි පහන්දම්	3.300	3.300	3.435	1600 100%	1600 100%
02	**සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම**					
	1. පිහිටුවා ඇති තුරුසවිය සමිති ශක්තිමත් කර ක්‍රියාකාරී කරවීමට අවශ්‍ය කටයුතු කිරීම හා අවශ්‍යතාවය අනුව නව සමිති පිහිටුවීම	0.670	0.670	0.681	සමිති 795 100%	සමිති 583 75%
	2. දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් දියත්කිරීම මට්ටම්හි පැවැත්වීම	0.520	0.520	0.528	37 පුහුණු වැඩසටහන් 100%	37 පුහුණු වැඩසටහන් 100%
03	**වෙනත්**					
	1 කාර්යාලීය ලි ඔඩු උපකරණ , පරිගණක හා වෙනත්	0.110	0.110	0.10094	100%	100%
	2. ක්ෂේත්‍ර අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	0.275	0.275	0.285	100%	100%
	3. පසුගිය වර්ෂයට අදාල රෝල් පෝඩු ගෙවීම් කිරීමට වෙන් කළ මුදල	4.200	4.2	4.265	100%	100%
	4. සමූහ සංවර්ධන ව්‍යාපෘති ඉදිකිරීම	0.250	0.250	0.240	100%	100%

2020 වර්ෂයේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘති(2020.12.31 දිනට)

	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුවේ වටිනාකම රු.මි.	මූල්‍ය ඉලක්ක රු.මි.	මූල්‍ය ප්‍රගතිය රු.මි.	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
01	1. නව තාක්ෂණයෙන් යුතු එක් දින වියලුම් කුටීර කුඩා රබර් ඉඩම් හිමියන්ට ලබා දීම *(සටහන 01)*	15.159	15.159	10.701	107	70
	2. රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය *(සටහන 02)*	7.500	7.500	4.965	ව්‍යාපෘති ප්‍රතිලාභීන් 380	ව්‍යාපෘති ප්‍රතිලාභීන් 159

➢ ***සටහන***

01. නව තාක්ෂණයෙන් යුතු එක් දින වියලුම් කුටීර කුඩා රබර් ඉඩම් හිමියන්ට ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලැබී ඇත්තේ 10.705 ක් පමණි.ඉන් 10.701 ක් ගෙවා අවසන් ය.එමෙන්ම 2019 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කරන ලද දුම් කාමර 22 ක් සඳහා මෙම වසර තුළදී ප්‍රතිලාභී සමිති වෙත ගෙවීම් සිදු කර ඇත.

02. ***කොවිඩ් වසංගත තත්ත්වය නිසා සැලසුම් කර ගත් පරිදි ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි විය.***
රබර් කිරි අස්වනු සහායකයින් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති රු.මි.4.965 ප්‍රතිපාදන ප්‍රමාණයෙන් මේ වන විට සියලු ගෙවීම් සිදු කර ඇත.(අනපේක්ෂිත ලෙස මුහුණ පෑ කොවිඩ්-19 තත්ත්වය හමුවේ ඉන් වැඩසටහන් 4 ක් පමණක් සැලසුම් කල පරිදි අවසන් කිරීමට හැකි විය. අවසන් කිරීමට නොහැකි වූ සෙසු වැඩසටහන් 03 2021 වසර තුළ දී තුරුසවිය අරමුදල ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය)

වෙන්කිරීම් - 2020					වියදම් (සමුච්චිත වියදම්) 31.12.2020						
ප්‍රාග්ධන		පුනරාවර්තන		මුළු වෙන්කිරීම් රු.මි.	ප්‍රාග්ධන			පුනරාවර්තන			මුළු වියදම්
DF රු.මි.	GF	DF රු.මි.	GF		මූල්‍ය ඉලක්ක රු.මි.	මූල්‍ය ප්‍රගතිය (DF) රු.මි.	GF	මූල්‍ය ඉලක්ක (DF) රු.මි.	මූල්‍ය ප්‍රගතිය (DF) රු.මි.	GF	රු.මි.
12.355	-	30.025	-	42.38	12.355	12.671	-	30.025	26.2140	-	38.885

DF-Domestic Fund *GF-Generated Fund*

තුරුසවිය සමිති සාමාජිකයින් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සම්පත් බෙදා දීම

2020

අනු. අංකය	දිස්ත්‍රික්කය	දිනය	ස්ථානය	පුහුණු වැඩසටහන	සාමාජික සංඛ්‍යාව
01	මොනරාගල	3/12	කරඳගම ප්‍රජා ශාලාව	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	51
02	කෑගල්ල	3/13	පානගමුව විහාරස්ථානය	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	58
03	කෑගල්ල	3/13	අරන්දර තුරුසවිය සමිතියේ ලේකම්තුමියගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	62
04	රත්නපුර	07/06	බටහිර මඳුන්කොටුව ප්‍රජා ශාලාව	සීලන්ට් ගම් මිශ්‍රණය නිෂ්පාදනය හා වැහි ආවරණ සවි කිරීමේ පුහුණු වැඩසටහන	72
05	රත්නපුර	07/07	හේවායින්න ප්‍රජා ශාලාව	සීලන්ට් ගම් මිශ්‍රණය නිෂ්පාදනය හා වැහි ආවරණ සවි කිරීමේ පුහුණු වැඩ සටහන	54
06	රත්නපුර	07/29	නැදුරණ සමගි තුරුසවිය සමිතියේ ලේකම්තුමියගේ නිවස	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	36
07	කෑගල්ල	07/28	පුකුණුවල විහාරස්ථානය	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	35
08	මාතර	07/24	ඌරුමුත්ත විහාරස්ථානය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	36
09	කෑගල්ල	07/24	කෙහෙල්පනල්ල නිත් කුමාර මහතාගේ දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	60
10	කළුතර	07/29	හැඩිගල්ල විපුලසිරි විහාරස්ථානය	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	28
11	මොනරාගල	07/28	තේරප්පහුව ප්‍රජා ශාලාව	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	54
12	කෑගල්ල	07/28	සැලව රජමහා විහාරස්ථානය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	53
13	කෑගල්ල	08/04	තල්ගහදෙණිය සමිති ප්‍රජා ශාලාව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	41
14	කෑගල්ල	07/28	ඒබ්ඩිගල සමිති ශාලාව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	63
15	කෑගල්ල	07/31	වැරැල්ලහේන දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	61
16	කළුතර	08/10	බටහේන තුරුසවිය සමිතියේ සභාපතිතුමාගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	44

අනු. අංකය	දිස්ත්‍රික්කය	දිනය	ස්ථානය	පුහුණු වැඩසටහන	සාමාජික සංඛ්‍යාව
17	මාතර	08/14	දීපාවිට සමිති ශාලාව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	36
18	ගාල්ල	08/25	බණ්ඩාරනායකපුර සඳුන් තුරුසවිය සමිතියේ සාමාජිකගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	26
19	කෑගල්ල	08/27	පොල්ගස්වත්ත විහාරස්ථානය	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	47
20	රත්නපුර	08/31	සිරි සුමේධ කොක්කෝවිට ප්‍රජා ශාලාව	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩ සටහන	38
21	කෑගල්ල	08/28	නිවුන්හැල්ල තුරුසවිය සමිතියේ සාමාජිකගේ දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	61
22	කෑගල්ල	08/31	දික්ඇල්ල තුරුසවිය සමිතියේ සාමාජිකගේ දුම් කාමරය ආශ්‍රිතව	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	59
23	මොනරාගල	09/03	මීගහයාය ප්‍රජා ශාලාව	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	38
24	රත්නපුර	08/31	පනාවල විහාරස්ථානය	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	41
25	රත්නපුර	09/03	මහින්දාරාම විහාරස්ථානය	රබර් වගාව,කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	67
26	කෑගල්ල	08/28	ගල්බොක්ක විහාරය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	60
27	හම්බන්තොට	08/28	වීරකැටිය තුරුසවිය සමිතියේ	මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	25
28	කෑගල්ල	09/02	පලමුරේ ශ්‍රී මහින්ද සමිති ශාලාව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	49
29	කුරුණෑගල	08/31	වදාව විහාරස්ථානය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	58
30	කෑගල්ල	09/18	මලවිට තුරුසවිය සමිතියේ ජයතිපක මහතාගේ දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	59
31	හම්බන්තොට	9/22	වීරකුටිය තුරුසවිය සමිතියේ සාමාජිකගේ නිවස	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	18

අනු. අංකය	දිස්ත්‍රික්කය	දිනය	ස්ථානය	පුහුණු වැඩසටහන	සාමාජික සංඛ්‍යාව
32	හම්බන්තොට	9/24	වැලිපිටිය ප්‍රජා ශාලාව	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	15
33	රත්නපුර	12/09	පනාවල විහාරස්ථානය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ හා නව තාක්ෂණ දුම් ගෙවල් ඉදි කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	62
34	රත්නපුර	12/21	කිරිඇල්ල උපදේශක සේවා දෙපාර්තමේන්තුව	රබර් වගාව කිරි කැපීම පසු විපරම් පිළිබඳ පුහුණු වැඩසටහන	51

තුරුසවිය සමිති මගින් සම්පත් බෙදා දීම

ගුණාත්මක භාවයෙන් යුතු රබර් ෂීට් නිෂ්පාදනය කිරීම සඳහා රබර් රෝල් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇත. රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූලව අතින් ක්‍රියාකරවන හා ඕනෑම තැනක ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක් භාවිතා කරමින් මෙම රබර් රෝල් සවිකර ගත හැක.කුඩා පරිමාණ ගොවින්ට මෙම සාම්ප්‍රදායික රබර් රෝල් යුගල තුළින් විශාල සේවයක් සිදු කර ගැනීමට හැකි වන අතර, 2020 වර්ෂයේ තුරුසවිය සමිති සඳහා රෝල් ජෝඩු 88 ක් ස්වාභාවික රබර් බූට්ස් 1600ක් හා හෙඩ් ටෝච් 1600 ක් තුරුසවිය සමිති වෙත ලබාදී ඇත.

තුරුසවිය අරමුදල

අවසන් ගිණුම් වාර්තාව - 2020

තුරුසවිය අරමුදල

2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

වත්කම්	**සටහන**	**2020** (රු.)	**2019**(රු.)
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**1**	2,440,763.89	2,801,241.30
		2,440,763.89	**2,801,241.30**
ජංගම වත්කම්			
මුදල් හා මුදල්වලට සමාන දෑ	**2**	16,267,181.18	9,701,721.29
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්	**3**	2,320,845.88	2,061,576.49
තොගය	උපලේඛනය-1	2,386,983.21	642,768.80
උපචිත ආදායම්	**4**	-	9,415,820.62
		20,975,010.27	**21,821,887.20**
මුළු වත්කම්		**23,415,774.15**	**24,623,128.49**
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	**5**	288,228.00	8,263,913.38
වැඩිපුර ගෙවූ වැටුප්		-	72,000.00
සේවක මණ්ඩල සුභසාධනය සඳහා		(2,500.00)	-
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්		1,425,000.00	725,000.00
		1,710,728.00	**9,060,913.38**
ජංගම නොවන වත්කම්			
පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම්	උපලේඛනය- 2	9,087,342.68	6,773,651.31
මුළු බැරකම්		**10,798,070.68**	**15,834,564.69**
මුළු ශුද්ධ වත්කම්		**12,617,703.47**	**8,788,563.80**
ශුද්ධ වත්කම් / හිමිකම්			
සෙස් අරමුදල		**27,000,000.00**	**27,000,000.00**
තුරුසවිය අරමුදල		**(15,650,314.53)**	**(19,474,854.20)**
සාමාජික මුදල්		**1,268,018.00**	**1,263,418.00**
ශුද්ධ වත්කම් / හිමිකම්		**12,617,703.47**	**8,788,563.80**

ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කර ඇත. (SLPSA)

ගණකාධිකාරී	අධ්‍යක්ෂ	සභාපති
ජේ.ජී.ජී. බණ්ඩාර	ආචාර්ය එස්.ඩබ්.ආර්.කේ. සිල්වා	වී. ලොකුනාරංගොඩ

පිටු අංක 6 සිට 14 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයේ අත්‍යවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල පූර්ණ වගකීමකට බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද අධ්‍යක්ෂවරුන් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇත.

අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ
ජී.ඩී.ටී.එස්. පෙරේරා	ජී.කේ.ආර්. ප්‍රියංකර
(ප්‍රධාන ගණකාධිකාරී - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය)	(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය				
	සටහන	**2020 (රු.)**		**2019(රු.)**
ආදායම්				
රජයේ ප්‍රදාන	**6**	38,156,250.00		46,561,250.00
කිරි කැපුම් ව්‍යාපෘතියේ ප්‍රදාන		4,964,852.22		7,782,496.82
දුම්ගෙවල් ව්‍යාපෘතියේ ප්‍රදාන		10,705,208.73		6,189,869.80
අනෙකුත් ආදායම්	**7**	744,543.60		1,154,235.73
සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ ප්‍රදාන				447,304.00
මුළු ආදායම්		**54,570,854.55**		**62,135,156.35**
මෙහෙයුම් වියදම්				
වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ	**8**	19,769,494.83		17,776,020.12
ගමන් වියදම්	**9**	169,787.78		736,228.92
සැපයුම් හා පාරිභෝගික වියදම්	**10**	8,743,564.57		6,759,548.21
ක්ෂය වියදම්		425,654.51		238,667.87
සංවර්ධන වියදම්	**11**	7,548,120.22		19,816,265.18
කිරි කැපුම් ව්‍යාපෘතියේ වියදම්		3,226,292.33		7,707,762.04
දුම්ගෙවල් ව්‍යාපෘතියේ සහනාධාර		10,792,836.01		6,190,908.80
සමූහ සැකසුම් මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමේ වියදම්		240,127.00		128,454.40
අනෙකුත් වියදම්	**12**	432,688.95		311,326.44
මුළු වියදම්		**51,348,566.20**		**59,665,181.99**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය (ඌනතාවය)		**3,222,288.35**		**2,469,974.36**

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකරුවන්ගේ ආරෝපිත පාලන ඒකක					
	ප්‍රාග්ධන දායකත්වය / අරමුදල	වෙනත් සුදාන හා සංචිත	සාමාජික මුදල් හා පරිපාලන ගාස්තු	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත ක්ෂය අතිරික්තය / ලාභාංශය	ශුද්ධ වත්කම් / හිමිකම්
	රු.		රු.		රු.	රු.
2017.12.31 දිනට ශේෂය	**27,000,000.0**	-	**1,231,303.00**	-	(19,976,336.40)	**8,254,966.60**
ආර්ම්භක ශේෂය ගැලපීම	-	-	-	-	(1,269,874.73)	**(1,269,874.73)**
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2018	-	-	**9,420.00**	-	-	**9,420.00**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත ලාභාංශය 2018	-	-	-	-	234,946.96	**234,946.96**
2018.12.31 දිනට ශේෂය	**27,000,000.0**	-	**1,240,723.00**	-	(21,011,264.17)	**7,229,458.83**
ආර්ම්භක ශේෂය ගැලපීම	-	-	**22,695.00**	-	-	**22,695.00**
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2019	-	-	-	-	2,469,974.36	**2,469,974.36**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත ලාභාංශය 2019					(933,564.39)	**(933,564.39)**
2019.01.01 දිනට ශේෂය	**27,000,000.0**	-	**1,263,418.00**	-	(19,474,854.20)	**8,788,563.80**
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2020	-	-	**4,600.00**			**4,600.00**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත ලාභාංශය 2019	-	-	-		3,222,288.35	**3,222,288.35**
පූර්ව කාල ගැලපුම්	-	-	-		602,251.32	**602,251.32**
2020.12.31 දිනට ශේෂය	**27,000,000.0**	-	**1,268,018.00**	-	(15,650,314.53)	**12,617,703.47**

තුරුසවිය අර්මුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020 (රු.)	**2019 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්ත ඌනතාවය	3,222,288.35	2,469,974.36
පූර්ව කාල ගැලපුම්	602,251.32	(933,564.39)
අඩු කිරීම් :		
පොලී ආදායම	(653,779.60)	(1,051,963.73)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**3,170,760.07**	**484,446.24**
මුදල් නොවන වෙනස්වීම්		
ක්ෂයවීම්	426,417.32	238,667.86
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	2,313,691.38	1,169,657.52
වෙළඳ හා අනෙකුත් ලැබීම්	(312,610.00)	(989,635.00)
තොගයෙහි අඩු වැඩි බව	(1,744,214.31)	1,214,927.81
ගෙවිය යුතු වියදම් හි අඩු වැඩි බව	(7,350,185.38)	7,186,437.48
උපචිත ආදායම්	9,415,820.62	(9,415,820.62)
මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් ශුද්ධ ප්‍රවාහය	**5,919,679.70**	**(111,318.71)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය		
දේපළ පිරියත හා උපකරණ	(65,940.00)	(2,057,587.30)
පොලී ලැබීම්	707,120.21	1,054,050.77
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**641,180.21**	**(1,003,536.53)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		
සාමාජික මුදල් දායකත්වය	4,600.00	22,695.00
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**4,600.00**	**22,695.00**
ශුද්ධ මූල්‍ය වැඩිවීම/අඩුවීම මුදල් හා මුදල්වලට සමාන දෑ	6,565,459.91	(1,092,160.24)
කාලපරිච්ඡේදය ආරම්භයේදී වූ මුදල් හා මුදල් වලට සමාන දෑ	9,701,721.27	10,793,881.51
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ	**16,267,181.18**	**9,701,721.27**

තුරුසවිය අරමුදල

2020.12.31 දිනට අයවැය සහ කාර්යසාධනය			
අයභාරය	**තථ්‍ය රු.**	**අයවැය ගත රු.**	**ප්‍රගතිය**
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	8,148,750.00	12,355,000.00	65.96%
රජයේ ප්‍රදාන පුනරාවර්තන	30,007,500.00	30,025,000.00	99.94%
අනෙකුත් ආදායම්	744,543.60	-	
අයභාර එකතුව	**38,900,793.60**	**42,380,000.00**	**91.79%**
විශේෂ ව්‍යාපෘති			
කිරි කැපුම් ව්‍යාපෘතියේ ප්‍රදාන	4,964,852.22	7,500,000.00	66.20%
දුම්ගෙවල් ව්‍යාපෘතියේ ප්‍රදාන	10,705,208.73	16,420,000.00	65.20%
අයභාර එකතුව	**15,670,060.95**	**23,920,000.00**	**65.51%**
පුනරාවර්තන වියදම්			
වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ	19,769,494.83	17,515,000.00	112.87%
ගමන් වියදම්	169,787.78	520,000.00	32.65%
සැපයුම් හා පාරිභෝජ්‍ය	8,743,564.57	11,990,000.00	72.92%
අනෙකුත් වියදම්	147,688.95	-	0.00%
අනෙකුත් වියදම්	425,654.51	-	0.00%
පුනරාවර්තන වියදම් එකතුව	**29,256,190.64**	**30,025,000.00**	**97.44%**
ප්‍රාග්ධන වියදම්			
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	32,940.00	110,000.00	29.95%
සංවර්ධන වියදම්	7,788,247.22	11,970,000.00	65.06%
ගොඩනැගිලි ධාරිතාවය	285,000.00	275,000.00	103.64%
ප්‍රාග්ධන වියදම් එකතුව	**8,106,187.22**	**12,355,000.00**	65.61%
විශේෂ ව්‍යාපෘති			
කිරි කැපීමේ ව්‍යාපෘතිය	3,226,292.33	7,500,000.00	43.02%
දුම්ගෙවල් ව්‍යාපෘතිය	10,792,836.01	16,420,000.00	65.73%
විශේෂ ව්‍යාපෘතිවල වියදම්වල එකතුව	**14,019,128.34**	**23,920,000.00**	**58.61%**
වියදම්වල එකතුව			
ප්‍රග්ධන	8,106,187.22	12,355,000.00	65.61%
පුනරාවර්තන	29,256,190.64	30,025,000.00	97.44%
විශේෂ ව්‍යාපෘතිය	14,019,128.34	23,920,000.00	58.61%
එකතුව	**51,381,506.20**	**66,300,000.00**	**77.50%**

1 දේපළ පිරියත හා උපකරණ

1.1 පිරිවැය

වත්කම්	ආරම්භක ශේෂය රු.	වසර තුළ එකතු කිරීම් රු.	ඉවත්කිරීම් / පැවරීම්	31.12.2020 දිනට ශේෂය රු.
පරිගණක උපාංග	2,405,798.28	33,000.00	-	2,438,798.28
පරිගණක මෘදුකාංග	396,000.00	-	-	396,000.00
කාර්යාල උපකරණ	1,349,566.00	32,940.00	-	1,382,506.00
කාර්යාල ලීබඩු	753,480.10	-	-	753,480.10
යන්ත්‍රෝපකරණ	392,702.18	-	-	392,702.18
මෝටර් රථ	-		-	-
	5,297,546.56	**65,940.00**	**-**	**5,363,486.56**

1.2 ක්ෂයවීම්

වත්කම්	ආරම්භක ශේෂය රු.	වසර තුළ එකතු කිරීම් රු.	ඉවත්කිරීම් / පැවරීම්	31.12.2020 දිනට ශේෂය රු.
පරිගණක උපාංග	623,600.73	224,920.50	-	848,521.23
පරිගණක මෘදුකාංග	3,193.55	99,000.00	-	102,193.55
කාර්යාල උපකරණ	906,538.77	55,574.09	-	962,112.86
කාර්යාල ලීබඩු	570,270.10	46,922.73	-	617,192.82
යන්ත්‍රෝපකරණ	392,702.18	-	-	392,702.18
මෝටර් රථ	-	-	-	-
	2,496,305.32	**426,417.32**	**-**	**2,922,722.64**

	(රු.) **2020**	(රු.) **2019**
1.3 පොත්වල ශුද්ධ අගය	**2,440,763.90**	**2,801,241.30**

		(රු.) 2020	(රු.) 2019
2	**මුදල් හා මුදල්වලට සමාන වස්තු**		
	බැංකු ගිණුම් අංකය: 014100163254138	5,881,188.92	748,339.24
	මහජන බැංකු ඉතිරි කිරීමේ ගිණුම	1,184,899.24	440,550.74
	ස්ථාවර තැන්පතු	9,201,093.02	8,512,831.31
	සුළු මුදල් පොත	-	-
	කිරි කැපුම් ව්‍යාපෘතිය සුළු මුදල්	-	-
		16,267,181.18	**9,701,721.29**
3	**වෙළඳ හා වෙනත් ලැබීම්**		
	රබර් ෂීට් මිලදී ගැනීමට අත්තිකාරම්	490,472.26	490,472.26
	තරාදි ණය	242,275.00	242,275.00
	ඩයමන්ඩ් රෝල් ණය	93,362.50	93,362.50
		826,109.76	**826,109.76**
	මුද්දර අත්තිකාරම්	5,000.00	1,730.00
	උත්සව අත්තිකාරම්	-	2,500.00
	තැන්පතු	6,500.00	6,500.00
	විවිධ අත්තිකාරම් (අනෙකුත් අත්තිකාරම්)		-
	ඉන්ධන අත්තිකාරම්	25,000.00	25,000.00
	අත්තිකාරම්	1,041,840.00	30,000.00
	කරවිට ජනපදය ණය යෝජනා ක්‍රමය	300,000.00	500,000.00
	ඈගල්ඔය ණය යෝජනා ක්‍රමය	-	500,000.00
	ආපසු ගෙවිය හැකි තැන්පතු	6,000.00	6,000.00
		1,384,340.00	**1,071,730.00**
		2,210,449.76	**1,897,839.76**
	කපා හැරීම්	-	-
			-
	ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොලිය	110,396.12	163,736.73
		110,396.12	**163,736.73**
	ණය ගැති ලැබීම් එකතුව	**2,320,845.88**	**2,061,576.49**
4	**උපචිත ආදායම්**		
	දුම්ගෙවල් ව්‍යාපෘතියේ ප්‍රදාන	-	4,389,869.80
	කිරි කැපීමේ ව්‍යාපෘතියේ ප්‍රදාන	-	474,496.82
	සමූහ සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ ප්‍රදාන	-	295,204.00
	උපචිත ප්‍රාග්ධනය	-	4,256,250.00
		-	**9,415,820.62**

		(රු.) 2020	(රු.) 2019
	උපචිත වියදම්		
5	උපචිත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	4,810.00	-
	උපචිත ජලය	-	1,027.14
	උපචිත අතිකාල	8,314.74	-
	උපචිත අනෙකුත් වියදම්	30,522.00	4,577,540.00
	උපචිත සමිති පිහිටුවීමේ හා ශක්තිමත් කිරීම	58,480.00	-
	උපචිත ගමන් වියදම්	4,025.00	18,205.00
	උපචිත ආරක්ෂක වියදම්	90,256.50	91,965.84
	උපචිත දුම්ගෙවල් ව්‍යාපෘතියේ සහනාධාර	91,365.76	3,301,039.00
	උපචිත කිරි කැපුම් ව්‍යාපෘතියේ වියදම්	454.00	272,886.00
	උපචිත සමූහ සැකසුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ වියදම්	-	1,250.40
		288,228.00	**8,263,913.38**
	රජයේ ප්‍රදාන		
6	ප්‍රාග්ධන	8,148,750.00	21,561,250.00
	පුනරාවර්තන	30,007,500.00	25,000,000.00
		38,156,250.00	**46,561,250.00**
	වෙනත් ආදායම්		
7	වෙනත් ආදායම්	70,580.00	72,833.00
	රබර් ෂීට් මිලදී ගැනීමේ දායකත්වය	20,184.00	29,439.00
	ස්ථාවර තැන්පතු සඳහා වාර්ෂික පොලිය	634,921.10	1,025,576.07
	ඉතිරි කිරීම් සඳහා වාර්ෂික පොලිය	18,858.50	26,387.66
		744,543.60	**1,154,235.73**
	වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ		
8	වැටුප්	11,493,005.55	10,477,060.24
	ජීවන වියදම් දීමනාවට	2,403,700.00	2,415,735.49
	විශේෂ දීමනාව	656,245.16	881,024.08
	නිවාඩු දින ගෙවීම්	4,637.50	2,434.65
	සේවක අර්ථසාධක අරමුදල	1,999,223.57	1,818,187.11
	සේවා නියුක්තිකයන්ගේ අරමුදල	399,844.73	363,637.42
	කළමනාකරණ මණ්ඩල දීමනා	142,500.00	112,500.00
	අතිකාල	100,424.45	206,770.70
	පාරිතෝෂික	2,569,913.87	1,498,670.43
		19,769,494.83	**17,776,020.12**
	ගමන් වියදම්		
9	ගමන් වියදම්	169,787.78	736,228.92
			736,228.92

		(රු.) 2020	(රු.) 2019
	පාරිභෝජන ද්‍රව්‍ය හා සැපයුම්		
10	තැපැල් හා සන්නිවේදන වියදම්	58,665.75	102,611.72
	විදුලි වියදම	167,282.00	180,972.45
	ජල වියදම	81,422.55	28,377.10
	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ වියදම්	474,916.71	785,846.57
	ඉන්ධන වියදම්	939,320.34	1,104,820.32
	වෙනත් සේවා සැපයුම්	-	-
	ගොඩනැගිලි කුලි	1,965,000.00	900,000.00
	වාහන නඩත්තු	1,893,111.62	1,750.00
	වාහන නඩත්තු	33,990.00	139,337.75
	ප්‍රවාහන වියදම්	20,700.00	83,800.00
	පුවත්පත්	6,150.00	8,040.00
	විගණන ගාස්තු	700,000.00	725,000.00
	ගොඩනැගිලි නඩත්තු	-	3,000.00
	දුරකතන	534,055.69	598,325.02
	ප්‍රචාරණ දැන්වීම්	272,862.00	508,566.25
	විගණන හා කළමනාකරණ කමිටු වියදම්	28,500.00	172,500.00
	සංග්‍රහ වියදම්	68,253.50	321,474.16
	කාර්යාල නඩත්තු	95,913.05	45,639.27
	ආරක්ෂක වියදම්	1,080,717.36	815,826.00
	සනීපාරක්ෂක සේවා වියදම්	322,704.00	233,661.60
		8,743,564.57	**6,759,548.21**
	සංවර්ධන වියදම්		
11	රෝල් ජෝඩු සහනාධාරය	3,036,000.00	2,792,500.00
	පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	526,709.30	744,910.15
	සමිති පිහිටුවීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන්	622,388.92	177,270.00
	දුම්ගෙවල් සහනාධාර	-	434,750.00
	ඇලුමිනියම් තැටි බෙදා දීමේ	91,022.00	1,578,995.53
	රබර් කිරි එකතු වන ප්ලාස්ටික් කෝප්ප බෙදාදීම	-	112,839.50
	කුඩා රබර් වතු හිමියන් සවිබල ගැන්වීම	3,272,000.00	13,975,000.00
		7,548,120.22	**19,816,265.18**
	වෙනත් වියදම්		
12	බැංකු ගාස්තු	35,453.60	43,478.44
	වෙනත් වියදම්	397,235.35	245,358.00
	නවාතැන් ගාස්තු	-	22,490.00
		432,688.95	**311,326.44**

උපලේඛනය - 1

2020.12.31 දිනට

අංකය	දිනය	විස්තරය	2020.12.31 දිනට ශේෂය		
			ප්‍රමාණය	ඒකක මිල රු.	වටිනාකම රු.
1		සීආර් පොත් 2	30	88.93	2,667.90
			10	88.93	889.30
			12	88.93	1,067.16
2		සීආර් පොත් 3	25	127.59	3,189.75
3		සීආර් පොත් 4	15	124.00	1,860.07
			15	136.34	2,045.10
4		සීආර් පොත් 6	15	197.75	2,966.31
5		සෙලෝ ටේප් 1"	27	26.30	710.10
6		සෙලෝ ටේප් 2"	39	50.72	1,978.08
8		ලිපිකවර 10X5	383	2.45	938.35
			1,000	2.45	2,450.00
9		ලිපිකවර 10X8	237	0.90	213.30
			500	2.58	1,290.00
			1,000	3.60	3,600.00
			1,000	3.60	3,600.00
10		ලිපිකවර 15X10	536	5.90	3,162.40
			1,000	6.45	6,450.00
11		ලිපිකවර 6X3	1,255	1.05	1,317.75
			500	0.95	475.00
			1,000	1.25	1,250.00
12		ලිපිකවර 9X4	2,969	1.80	5,344.20
			5,000	1.80	9,000.00
13		මකන	10	4.75	47.50
14		ක්ෂේත්‍ර සටහන් පොත් (රූල් ඇති)	29	47.58	1,379.82
			162	53.54	8,673.48
15		ක්ෂේත්‍ර සටහන් පොත් (රූල් නැති)	64	46.40	2,969.60
16		ෆයිල්	702	4.04	2,836.15
			10	10.00	100.00
			1000	4.04	4,040.10
			1600	4.37	6,992.00
17		ෆයිල්	2882	2.54	7,306.88
			600	2.38	1,428.60
18		ප්'නල් - 138A	4	172.50	690.00
			2	56.00	112.00
19		ප්'නල් -268	22	80.50	1,771.00
20		ප්'නල් -58	2	253.00	506.00
21		ගම් බෝතල්	5	73.14	365.70
22		හාෆ්ෂීට් පැකට්	43	471.45	20,272.35

අංකය	දිනය	විස්තරය	2020.12.31 දිනට ශේෂය		
			ප්‍රමාණය	ඒකක මිල රු.	වටිනාකම රු.
23		හයිලයිටර් - නිල්	11	52.60	578.60
25		හයිලයිටර් - රෝස	3	51.00	153.00
			12	52.60	631.20
26		ලිපි ශීර්ෂ	4,600	4.75	21,850.00
27		පේපර් ක්ලිප් පැකට්	33	26.25	866.25
28		පේපර් පීඑස්එම් නිල්	277	1.33	368.97
			500	2.09	1,047.01
29		පේපර් පීඑස්එම් කොළ	225	1.33	299.25
			500	2.09	1,047.01
30		පේපර් පීඑස්එම් ලාරෝස	322	1.57	505.54
			500	1.33	666.00
31		පේපර් පීඑස්එම් රෝස 1	370	1.54	569.99
32		පේපර් පීඑස්එම් කහ	427	2.09	894.15
33		කාබන් පෑන් කළු	21	13.23	277.83
			200	16.01	3,202.00
			100	15.67	1,567.00
34		කාබන් පෑන් නිල්	10	15.64	156.40
			415	15.67	6,503.05
35		කාබන් පෑන් රතු	42	13.23	555.66
			100	16.01	1,601.00
			100	15.67	1,567.00
36		චෙක්පත් ලියන පෑන්	44	49.25	2,167.00
37		පැන්සල්	2	12.94	25.88
			24	12.15	291.60
38		ෆොටෝ කොපි පැකට් - A4 Packets	90	734.40	66,096.00
39		රිසිට් පොත්	156	175.00	27,300.00
40		ස්පයිරල් 10mm	9	5.50	49.50
41		ස්පයිරල් 12mm	36	8.50	306.00
42		ස්ටැම්ප් පෑඩ් (Lancer Medium)	2	261.00	522.00
43		ස්ටේප්ලර් කටු	4	41.43	165.72
			10	33.91	339.10
			50	33.91	1,695.50
44		ස්ටෙන්සිල් පේපර් පැකට්	2	680.00	1,360.00
45		ස්ටේප්ලර් කටු - Heavy Duty	4	113.68	454.72
			10	162.40	1,624.00
			20	131.44	2,628.80
46		ස්ටික් නෝට් පෑඩ්	2	64.69	129.38
			50	264.00	13,200.00
47		ටිපෙක්ස්	19	58.00	1,102.00
48		ටෝනර් (Lexmark Printer)	13	17,000.00	221,000.00
49		විනිවිද පෙනෙන කොළ	121	6.59	797.28
50		හාඩ් බෝඩ්	46	13.69	629.74

අංකය	දිනය	විස්තරය	2020.12.31 දිනට ශේෂය		
			ප්‍රමාණය	ඒකක මිල රු.	වටිනාකම රු.
51		ප'නල් - 198	9	170.20	1,531.80
52		ජී සිංහල 5/74	1	38.08	38.08
			3	230.00	690.00
53		ප'නල් 18	1	38.08	38.08
			2	172.50	345.00
54		බයින්ඩින් ටේප් 2"	6	169.70	1,018.20
			24	169.70	4,072.80
55		හයිලයිටර් කහ	2	51.00	102.00
			12	52.60	631.20
56		ප'නල් - 231	15	161.00	2,415.00
57		ෆොටෝ කොපි කොළ (14x80gsm)	3	1,001.65	3,004.95
58		ප'නල් 190	6	170.20	1,021.20
59		රෝනියෝ කොළ පැකට්	19	305.00	5,795.00
60		Epson LQ 2090 රිබන්	1	3,220.00	3,220.00
61		ස්පැනර්	5	9.92	49.60
62		රබර් කිරි එකතු වන ප්ලාස්ටික් කෝප්ප	648	17.50	11,340.00
63		ලැමිනේටින් බොක්ස් ෆයිල්	89	183.14	16,299.46
64		සීඩී සහිත කවර	48	145.51	6,984.48
65		පන්චර්	3	356.50	1,069.50
66		ස්ටේප්ලර් මැෂින්	4	299.00	1,196.00
			3	289.09	867.27
67		හයිලයිටර් තැඹිලි	3	51.00	153.00
			12	52.60	631.20
68		කාබන් කොළ	3	469.00	1,407.00
69		ගම් කූරු	2	34.50	69.00
70		අඩි රූල්	10	27.70	277.00
71		රබර් ගම් බ්‍රට්ස්	216	999.00	215,784.00
72		හිසේ පළඳින ලාම්පු	216	845.00	182,520.00
73		ලොක් ටේප්	216	330.00	71,280.00
74		ටේලර් ටේප්	216	20.00	4,320.00
75		කබා	215	1,100.00	236,500.00
76		ටී ෂර්ට්	215	700.00	150,500.00
77		බෑග්	216	1,050.00	226,800.00
78		සිටෙන්සිල් ප්ලේට් විත් ස්ටික්ස්	216	590.00	127,440.00
79		කිරි පිහි	215	900.00	193,500.00
80		ඔෆිස් පින්	14	29.20	408.80
82		දූවිලි පිස්නා	12	79.01	948.06
83		ෆොටෝ කොපි ටෝනර්	1	8,640.00	8,640.00
84		විදුලියෙන් ක්‍රියාකරන ඩයමන් හා දියරෝල් මැෂිම	10	32,000.00	320,000.00
85		සීආර් පොත් 5	5	185.60	928.00
86		උපදේශන චක්‍රලේඛ එකතුව	268	300.00	80,400.00
		අවසාන ශේෂය			**2,386,982.74**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PLA/C/TSF /01/20/03 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 සැප්තැම්බර් ෭ දින

සභාපති

තුරුසවිය අරමුදල

තුරුසවිය අරමුදල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත:- ලේකම්, මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PLA/C/TSF /01/20/03 මගෙ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 සැප්තැම්බර් ,0 දින

සභාපති

තුරුසවිය අරමුදල

තුරුසවිය අරමුදල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තුරුසවිය අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ 21(2) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 1,610,331 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී ජනාධිපති කාර්යාලයෙන් ලැබී තිබුණු එකතු වටිනාකම රු.22,600,000 ක් වූ වාහන 07 ක් නීත්‍යානුකූලව පවරාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් 2018 වර්ෂයේ වැවිලි අමාත්‍යාංශය වෙතින් ලැබුණු ලීබඩු උපකරණ ඒකක 89 ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමි යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදලේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම්කරණය කිරීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන ඍර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් **අවශ්‍යතාවය** අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැදුම්කරවල වුවද, 2017 වර්ෂයේ සිට මාස 06 ක කෙටිකාලීන තැන්පතුවල රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන මුදල රු.9,201,093 ක් විය.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
2000 අංක 23 දරන තුරුසවියඅරමුදල පනතේ 13 වගන්තියේ (අ) කුඩා රබර් වතු හිමියන්ට ඉතිරිකිරීමේ පුරුද්ද ඇතිකරවීම සහ ඔවුන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම, (ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීමට (ඇ) කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය රබර් පිරි සැකසුම් ඒකක සහ රබර් කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩිදියුණු කර ගැනීම හෝ පිහිටුවීම (ඈ) එවැනි රබර් පිරි සැකසුම් ඒකකවල හෝ කර්මාන්ත ශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම	මෙම පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් විගණන නිරීක්ෂණ**

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 03 ක පුහුණුවීම් නොපැවැත්වූවද එම පුහුණුවී වලට සහභාගිවීමට නියමිතව සිටි රබර් කිරි කැපුම් ශිල්පීන් වෙත ලබාදීමට මිළදී ගෙන තිබුණු රු.1,719,984 ක් වටිනාකමැති විදුලි පන්දම්, මෙවලම් මළු , ටිෂර්ට් සහ මෙවලම් උපකරණ යනාදී වර්ග 10 ක් 2021 මැයි මාසය දක්වාම පාවිච්චියට ගැනීමකින් තොරව ගබඩාව තුළ පැවතුණි.

(ඇ) කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 30 ක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් සහ ණය මුදල්වලින් රු.826,109 ක් වූ ලැබිය යුතු ශේෂයක් වර්ෂ 05 ක කාලයක් පැවති නමුත් අයකර ගැනීමට නොහැකිව පැවතිණි. එසේම මෙම සමිති සමාලෝචිත වර්ෂය වන විට ක්‍රියාත්මක වෙමින් පවතින්නේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

(ඈ) කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි තුරුසවි සමිති සංඛ්‍යාව 815 ක් වූ අතර මෙම සමිතිවලින් ක්‍රියාත්මක වෙමින පවතින සමිති මෙතෙක් හඳුනාගෙන නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ස්ථාපිත කරනු ලැබූ ග්‍රාමීය රබර් සංසද 130 ක් හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඵලදායී වන අයුරින් ක්‍රියාකාරීව පවත්වාගෙන යාමට තුරුසවිය වෙත පවරා ගන්නා ලෙස වැවිලි අමාත්‍යාංශයෙන් නියෝග දී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් අරමුදල වෙත ලැබී තිබුණු රු.2,000,000 ක් වටිනාකමැති මෝටර් වාහනයක් ධාවනය කිරීමට නොහැකිව අරමුදල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(උ) අරමුදල විසින් ඉකුත් වර්ෂයේදී තුරුසවි සමිති 02 ක් සඳහා රු.500,000 ක් බැගින් මාස 06 ක් ඇතුළත ගෙවීමේ පදනම යටතේ සියයට 4 ක පොලියට ලබාදුන් රු.1,000,000 ක ණය මාස 06 ක කාල පරිච්ඡේදය තුළ අයකර ගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු රු.300,000 ක ණය මුදල වෙනුවෙන් පොලී සහ දඩ මුදල් ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2005 වර්ෂයේදී ඇරැපොල සහ 2008 වර්ෂයේදී ගණේපල්ල රබර් ෂීට් සමූහ සැකසුම් මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීම ආරම්භ කර රු.1,000,184 ක් වියදම් කර තිබුණි. කෙසේ වුවද සැකසුම් මධ්‍යස්ථාන දෙකෙහි ඉදිකිරීම් ආරම්භකර වර්ෂ 15 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති